සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

උපදෙස් :

(i) සියලු ම සිසුන් I කොටසේ මුල් ප්‍රශ්න 30 ට අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතුයි. එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක කොටසකට පමණක් අංක 31 සිට අංක 40 දක්වා පිළිතුරු සැපයිය යුතුයි.

(ii) II, III හා IV වන කොටස්වලින් අංක 31 සිට 40 දක්වා කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දක්විය යුතුය.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

සැලකිය යුතුයි :

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

(01) උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන්හි හස්ත, පාද හැසිරවීමේ මූලික සරඹ පිළිවෙලින් ............................................... නමින් හැඳින්වේ.

(1) ගොඩ සරඹ, දොඹින පද හා ඉලංගම් සරඹ
(2) ඉලංගම් සරඹ, දොඹින පද හා ගොඩ සරඹ
(3) දොඹින පද, ඉලංගම් සරඹ හා ගොඩ සරඹ
(4) ගොඩ සරඹ, ඉලංගම් සරඹ හා දොඹින පද

(02) නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණයේ දී ................................................ අත්‍යවශ්‍ය සාධකයක් නොවේ.

(1) උචිත තේමාවක් තෝරා ගැනීම
(2) උචිත චලන භාවිතය
(3) වාචික අභිනය
(4) භාව ප්‍රකාශ වීම

(03) ................................................ තාණ්ඩව ලක්ෂණ සහිත චලන භාවිත කරනු ලැබේ.

(1) කළ නැටුම් සඳහා
(2) කඩු නැටුම් සඳහා
(3) මෝල් ගස් නැටුම් සඳහා
(4) කුළු නැටුම් සඳහා

(04) මාත්‍රා 2 + 2 + 3 තිත් රූපය ................................................ නමින් හඳුන්වනු ලැබේ.

(1) දෙසුළු මැදුම් තුන් තිත
(2) සුළු මැදුම් මහ තුන් තිත
(3) දෙසුළු මහ තුන් තිත
(4) දෙමැදුම් මහ තුන් තිත

(05) — , ^ , ⁄ , ‿ ප්‍රස්තාරකරණයේ දී භාවිත මෙම සංකේත මගින් හැඳින්වෙන්නේ,

(1) මාත්‍රාවක් ඇදෙන බව, තෙයි, තිත්, අක්ෂර කීපයක් එකතු කිරීම
(2) මාත්‍රාවක් ඇදෙන බව, තිත්, තෙයි අක්ෂර කීපයක් එකතු කිරීම
(3) අක්ෂර කීපයක් එකතු කිරීම, තෙයි, තිත්, මාත්‍රාවක් ඇදෙන බව
(4) තෙයි, තිත්, මාත්‍රාවක් ඇදෙන බව, අක්ෂර කීපයක් එකතු කිරීම

Department of Education – Western Province

(06) 'භරත මුනිගෙ නාට්‍ය ශාස්ත්‍රය' නම් ග්‍රන්ථයෙහි සඳහන් රස ගණන

(1) හතකි. (2) අටකි. (3) නවයකි. (4) දහයකි.

(07) 'පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා' මෙම කවි පදයට අයත් ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යාව

(1) ලඝු 12 ගුරු 03 (2) ලඝු 13 ගුරු 02

(3) ලඝු 15 ගුරු 01 (4) ලඝු 08 ගුරු 04

(08) ලී කෙළි හා කුළු, සිංහල ගැමි නැටුම් හා සමාන ද්‍රවිඩ ගැමි නැටුම් වනුයේ,

(1) කාවඩි හා කොහොඹා කලය (2) සුලකු හා සෙම්බු

(3) කෝලාට්ටම් හා සුලකු (4) සුලකු හා කෝලාට්ටම්

(09) නර්තන කලාවෙහි ප්‍රධාන මාධ්‍ය වන්නේ,

(1) චලනයයි. (2) සතර අභිනයයි.

(3) නාදයයි. (4) රේඛාවයි.

(10) ඇඳුම් පැළඳුම්, ආලෝකකරණය, පසුතල නිර්මාණ ආදිය අයත් වන්නේ,

(1) ආංගික අභිනයට (2) සාත්ත්වික අභිනයට

(3) ආහාර්ය අභිනයට (4) වාචික අභිනයට

(11) බෙර වාදනය ඉගෙන ගැනීමේ දී අප පළමුව කළ යුත්තේ,

(1) බෙර සරඹ වාදනය කිරීම (2) අක්ෂර වාදනය හඳුනා ගැනීම

(3) බෙර පද වාදනය කිරීම (4) ලය අනුව බෙර පද වාදනය කිරීම

(12) අපල උපද්‍රව දුරුකිරීම සඳහා කරනු ලබන ගායනයකි.

(1) ටීකා සී පද (2) තෙතඟු කවි (3) ප්‍රශස්ති (4) ග්‍රහපන්ති කවි

(13) 'රටකට මවුසමගින් එනැව් නැග....' යනුවෙන් ගයන්නේ,

(1) චාමර කවියකි. (2) පන්තේරු කවියකි.

(3) ප්‍රශස්ති කවියකි. (4) රබන් කවියකි.

(14) කාන්තාවන් විසින් පමණක් ඉදිරිපත් කරනු ලබන ගැමි නැටුම් විශේෂයකි.

(1) මෝල් ගස් නැටුම (2) කඩු නැටුම

(3) උඩැක්කි නැටුම (4) ලී කෙළි නැටුම

(15) නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු ඇතුළත් 'ඉබන් බතුතා' නම් විදේශිකයාගේ වාර්තා හමුවන්නේ,

(1) අනුරාධපුර යුගයෙනි. (2) මහනුවර යුගයෙනි.

(3) ගම්පොළ යුගයෙනි. (4) දඹදෙනි යුගයෙනි.

(16) ප්‍රාසාංගික බව හා විවිධාංගිකරණය සඳහා භාවිත වන තාක්ෂණ උපක්‍රම 02කි.

(1) ආලෝකකරණය හා ඇඳුම් නිර්මාණය

(2) විවිධ පසුතල මැවීම හා ආලෝකකරණය

(3) සංගීතය හා පිටපත

(4) අංග රචනය හා නර්තනය

Department of Education - Western Province

(17)



A



B

A හා B රූපවලින් දක්වෙන්නේ,

(1) වජිරා චිත්‍රසේන මිය, මිරැන්ඩා හේමලතා මිය

(2) මිරැන්ඩා හේමලතා මිය, වජිරා චිත්‍රසේන මිය

(3) වජිරා චිත්‍රසේන මිය, චන්ද්‍රලේඛා මිය

(4) චන්ද්‍රලේඛා මිය, මිරැන්ඩා හේමලතා මිය

(18) කෝලම් ගැමි නාටකය සඳහා භාවිත ප්‍රධාන වාද්‍ය භාණ්ඩය,

(1) ගැට බෙරයයි. (2) උඩැක්කියයි.

(3) දවුලයි. (4) යක් බෙරයයි.

(19) 'කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ' මෙම කවියෙන් ප්‍රකාශවන්නේ,

(1) සොකරි නාටකයේ සොකරි පිළිබඳ (2) සොකරි නාටකයේ ගුරුහාමි පිළිබඳ

(3) සොකරි නාටකයේ වෙදරාල පිළිබඳ (4) සොකරි නාටකයේ පරයා පිළිබඳ

- **ප්‍රශ්න අංක 20 සිට 24 තෙක් නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.**

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | කොහොඹා කංකාරිය | දේවකෝල් පාඩුව | සන්නි යකුම | උඩැක්කි වාදනය |
| 2 | අතාෂා බෙර | දෙවොල් මඩුව | අස්නෙ | තෙල්මෙ |
| 3 | පහන් මඩුව | මගුල් බෙර වාදනය | රබන් වාදනය | යක් ඇන්නුම |

(20) පහතරට නර්තන සම්ප්‍රදායෙහි දෙවියන් වෙනුවෙන් කරනු ලබන ශාන්තිකර්මය සඳහන් වන්නේ,

(1) 1 පේළියේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.

(3) 1 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ A තීරුවේ ය.

(21) ශාන්ති කර්මයන්හි දැකිය හැකි පොදු වාදන අංගයක් ඇතුළත් වන්නේ,

(1) 3 පේළියේ B තීරුවේ ය. (2) 2 පේළියේ A තීරුවේ ය.

(3) 3 පේළියේ C තීරුවේ ය. (4) 1 පේළියේ D තීරුවේ ය.

(22) සබරගමු සම්ප්‍රදායට අයත් නර්තන අංගයක් සඳහන් වන්නේ,

(1) 2 පේළියේ D තීරුවේ ය. (2) 2 පේළියේ C තීරුවේ ය.

(3) 1 පේළියේ B තීරුවේ ය. (4) 3 පේළියේ D තීරුවේ ය.

(23) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනා රහිත නර්තන අංගයක් ඇතුළත් වන්නේ,

(1) 1 පේළියේ B තීරුවේ ය. (2) 2 පේළියේ C තීරුවේ ය.

(3) 2 පේළියේ D තීරුවේ ය. (4) 3 පේළියේ D තීරුවේ ය.

Department of Education – Western Province

(24) පහතරට නර්තන සම්ප්‍රදායෙහි සමූහ නර්තන අංගයක් ඇතුළත් වන්නේ,

(1) 1 පේළියේ B තීරුවේ ය. (2) 2 පේළියේ C තීරුවේ ය.

(3) 2 පේළියේ D තීරුවේ ය. (4) 3 පේළියේ D තීරුවේ ය.

(25) සත් පත්තිනි හා චන්ඩාලිකා මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) ප්‍රේමකුමාර මහතා හා චිත්‍රසේන මහතා
(2) පණීභාරත මහතා හා චිත්‍රසේන මහතා
(3) චිත්‍රසේන මහතා හා පණීභාරත මහතා
(4) පණීභාරත මහතා හා ප්‍රේමකුමාර මහතා

(26) කථකලි නර්තන සම්ප්‍රදායෙහි නිජබිම ලෙස සලකන්නේ,

(1) උත්තර භාරතීය ඇසෑම් ප්‍රදේශය
(2) උත්තර භාරතීය ලක්නව් ප්‍රදේශය
(3) දක්ෂිණ භාරතීය තමිල්නාඩු ප්‍රාන්තය
(4) දක්ෂිණ භාරතීය කේරළ ප්‍රාන්තය

(27) 'හනික වරෙව් කොල්ලනේ / මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ' මෙම ගීත දෙක අයත් නාට්‍ය යුගලය නම්,

(1) බෙර හඬ හා විධුර (2) විදුර හා රාමායනය

(3) බෙර හඬ හා සිරිසඟබෝ (4) රාජකපුරු හා වෙස්සන්තර

(28) අංග රචනය සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍යයක් හා උපකරණයකි.

(1) පදනම් ආලේපය හා තොල් ආලේපය
(2) පදනම් ආලේපය හා ඇස් ආලේපය
(3) පදනම් ආලේපය හා පින්සල්
(4) ඇස් ආලේපය හා රෝස පවුඩර්

(29) සාම්ප්‍රදායික බෙර වාදන ඇඳුම් කට්ටලයක දැකිය හැකි ප්‍රධාන වර්ණ දෙක නම්,

(1) සුදු හා කළු (2) කළු හා නිල් (3) සුදු හා රතු (4)කළු හා රතු

(30) නර්තන කලාව හැදෑරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) ශාරීරික නම්‍යතාව පවත්වා ගැනීම
(2) නිවැරදි වචන උච්චාරණය පහසුවීම
(3) ශාරීරික නිරෝගීතාව ඇතිවීම
(4) නර්තනය හා බැඳි සාරධර්ම යහපත් දිවි පෙවතකට ඉවහල් වීම

## II කොටස - උඩරට නර්තනය

(31) උඩරට වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ දෙකකි.

(1) වාදාංකුස රත්නමාලය හා උඩරට නැටුම් කලාව
(2) උඩරට නැටුම් කලාව හා කළගෙඩි මාලය
(3) වාදාංකුස රත්නමාලය හා සබරගමු නාට්‍ය කලාව
(4) සබරගමු නාට්‍ය කලාව හා ශෘංගාලංකාරය

Department of Education – Western Province

(32) තාකු තකුං තරිකිට තකුද තත් ජෙං..... මෙලෙස ආරම්භ වන්නේ,

(1) සිංහරාජ වන්නමට අයත් අඩව්වයි.
(2) මුසලඩි වන්නමට අයත් අඩව්වයි.
(3) සැවුලා වන්නමට අයත් අඩව්වයි.
(4) තුරගා වන්නමට අයත් අඩව්වයි.

(33) මුසලඩි වන්නම නටනු ලබන්නේ,

(1) මාත්‍රා 12 / 12 / 1234 තුන්තිතට ය.
(2) මාත්‍රා 123 / 1234 දෙතිතට හා 123 / 123 තනි තිතට ය.
(3) මාත්‍රා 12 / 12 / 123 තුන්තිතට
(4) මාත්‍රා 12 / 1234 දෙතිතට ය

(34) සුළු මැදුම් දෙතිතට අයත් බෙර පදයකි.

(1) දොං දොං ජිං ජිංගජිගත
(2) කුද ගත ගත දොං
(3) දොං ජිංත ගත දොංත
(4) දොදොංතකු තකු දොං

(35) උඩරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ කතුවරයෙකි.

(1) විල්සන් ඔලබොඩුව මහතා
(2) ගෝමිස් මහතා
(3) චිත්‍රසේන මහතා
(4) මුදියන්සේ දිසානායක මහතා

(36) උඩරට වෙස් ඇදුම් කට්ටලයට අයත් ආභරණයකි.

(1) පායින් පත
(2) නළල් පටිය
(3) හැඩකැල්ල
(4) කඩුක්කන්

(37) කොහොඹා කංකාරියෙහි ඇතුළත් නාට්‍යමය පෙළ පාලියකි.

(1) නයා යක්කම
(2) අසුර යක්කම
(3) දෙවොල් ගොඩ බැසීම
(4) නානු මුරය

(38) 'කුදංත ගත දොං' වට්ටම නටනු ලබන්නේ,

(1) තනි තිතේ තාලයට ය.
(2) දෙතිතේ තාලයට ය.
(3) තුන් තිතේ තාලයට ය.
(4) සිව් තිතේ තාලයට ය.

(39) 'සිරි ගත්ත සඳු පත්ව මුදුනින්.....' මුසලඩි වන්නමට අයත් මෙම කවියෙහි ඊළඟ පදය වන්නේ,

(1) මහත් සමගියෙන් දුව පැන
(2) කලක් වසන තැනින් දුවන
(3) පිටත් පොට ගසා පනිමින
(4) විටත් ඔවුන තුටත් සිතින

(40) පහතරට නර්තන සම්ප්‍රදායෙහි ඉරට්ටියට සමානව උඩරට නර්තන සම්ප්‍රදායෙහි නටනු ලබන්නේ,

(1) කස්තිරමයි.
(2) අන්තාඩියයි.
(3) අඩව්වයි.
(4) කලාසමයි.

Department of Education – Western Province

## III කොටස - පහතරට නර්තනය

(31) පහතරට සින්දු වන්නම් රචනා කල බවට සලකනු ලබන්නේ,

(1) බරණ ගණිතයා විසින් (2) ගණිතාලංකාර විසින්

(3) මල්වතු පාර්ශවයේ භික්ෂුනමක් විසින් (4) පරාක්‍රමබාහු රජු විසින්

(32) 'තත් ගුදගත දිත් දිත් තෙයි....' මෙලෙස ආරම්භ වන්නේ,

(1) ශුද්ධ තාලය සින්දු වන්නමට නටනු ලබන අන්තාඩියයි.

(2) ශුද්ධ තාලය සින්දු වන්නමට නටනු ලබන ඉරට්ටියයි.

(3) අනුරාග දණ්ඩ තාලය සින්දු වන්නමට නටනු ලබන ඉරට්ටියයි.

(4) නාතිලිංචි තාලය සින්දු වන්නමට නටනු ලබන ඉරට්ටියයි.

(33) ශුද්ධ තාලය සින්දු වන්නම නටනු ලබන්නේ,

(1) මාත්‍රා 1 2 3 / 1 2 3 තනි තිතට ය.

(2) මාත්‍රා 1 2 / 1 2 / 1 2 3 තුන් තිතට ය.

(3) මාත්‍රා 1 2 / 1 2 3 4 දෙතිතට ය.

(4) මාත්‍රා 1 2 3 / 1 2 3 4 දෙතිතට ය.

(34) සුළු මැදුම් දෙතිතට අයත් බෙර පදයකි.

(1) දිත්තම් දිතකු දොම් දොම් තා (2) ගුද ගති ගත ගුද ගුද ගති ගත

(3) ගුං දෙගත ගත්ත ගුං (4) තක දිත් තක දොං දොං දිංතක දොං

(35) පහතරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ කතුවරයෙකි.

(1) විල්සන් ඔලබොඩුව මහතා

(2) වික්‍රමසිංහ බණ්ඩාර මහතා

(3) චිත්‍රසේන මහතා

(4) ජයසේන කෝට්ටේගොඩ මහතා

Department of Education – Western Province

(36) පහතරට තෙල්මෙ ඇදුම් කට්ටලයට අයත් ආභරණයකි.

(1) නළල් පටිය (2) බුබුලු පටිය

(3) හැඩකැල්ල (4) පායින්පත

(37) දෙවොල් මඩු ශාන්ති කර්මයේ ඇතුළත් නාට්‍යමය පෙළපාළියකි.

(1) අඹ විදමන (2) හත්තාලය නැටීම

(3) ඌරා යක්කම (4) පොත් කඩේ පාලිය

(38) 'ගුද ගති ගත' වට්ටම නටනු ලබන්නේ,

(1) තුන් තිතේ තාලයට ය. (2) දෙතිතේ තාලයට ය.

(3) තනි තිතේ තාලයට ය. (4) සිව් තිතේ තාලයට ය.

(39) ''සිරි පිරි ගිරි...................... සුර පුර ලෙසිනා, සිරිලක.................... දෙව් නුවරෙහි වෙසෙසවනා....''

ශුද්ධ තාලය සින්දු වන්නමට අයත් මෙම කවියේ හිස්තැනට අදාල වචන දෙක වන්නේ,

(1) සිරිසඳ, සමගිව (2) සුරිඳුනි, මකියන

(3) සමගිව, මකියන (4) මුදුනත, පවර

(40) උඩරට නර්තන සම්ප්‍රදායේ කස්තිරමට සමානව පහතරට නර්තන සම්ප්‍රදායේ නටනු ලබන්නේ,

(1) ඉරට්ටියයි. (2) අඩව්වයි.

(3) කලාසමයි. (4) සුරලයි.

## IV කොටස - සබරගමු නර්තනය

(31) සබරගමු වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ දෙකකි.

(1) සබරගමු නාට්‍ය කලාව හා කිරිඇල්ලේ ඥානවිමල හිමිගේ පැරණි වන්නම්

(2) සබරගමු නාට්‍ය කලාව හා උඩරට නැටුම් කලාව

(3) වාදාංකුස රත්නමාලය හා උඩරට නැටුම් කලාව

(4) සබරගමු නාට්‍ය කලාව හා එරන්දතී වර්ණනාව

(32) ''තාත් තජ්ජිත් තකට තත්ජිත්.....'' මෙලෙස ආරම්භ වන්නේ,

(1) මණ්ඩුක වන්නමට නටනු ලබන අඩව්වයි.

(2) කොවුලා වන්නමට නටනු ලබන අඩව්වයි.

(3) විරාඩි වන්නමට නටනු ලබන අඩව්වයි.

(4) මුසලඩි වන්නමට නටනු ලබන අඩව්වයි.

(33) මණ්ඩුක වන්නම නටනු ලබන්නේ,

(1) මාත්‍රා 3 + 3 තනි තිතට අනුව ය.

(2) මාත්‍රා 3 + 4 දෙතිතට අනුව ය.

(3) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට අනුව ය.

(4) මාත්‍රා 2 + 4 දෙතිතට අනුව ය.

(34) සුළු මැදුම් දෙතිතට අයත් දවුල් පදයකි.

(1) ගුද ගතිගත ගුද ගුද ගති ගත (2) දිත්තම් දිතකු දොම් දොම් තා

(3) ජිං ජිමිත තත් තකට (4) ජිං කිටි තත් තත් කිටිතක

(35) සබරගමු නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ කතුවරියෙකි.

(1) මිරැන්ඩා හේමලතා මිය (2) වජිරා චිත්‍රසේන මිය

(3) රජිණි සෙල්වනායගම් මිය (4) ශ්‍රියාණි රාජපක්ෂ මිය

(36) සබරගමු පබලු ඇඳුම් කට්ටලයට අයත් ආභරණයකි.

(1) නෙත්තිමාලය (2) පායින්පත

(3) අවුල්හැරය (4) තෙල්කච්චිය

(37) පහන්මඩු ශාන්ති කර්මයේ ඇතුළත් නාට්‍යමය පෙළපාලියකි.

(1) පොත් කඩේ පාලිය (2) නයා යක්කම

(3) මුවමල විදීම (4) නානුමුරය

(38) පට්ටුතාල මාත්‍රය නටනු ලබන්නේ,

(1) තනි තිතේ තාලයට ය. (2) දෙතිතේ තාලයට ය.

(3) තුන් තිතේ තාලයට ය. (4) සිව් තිතේ තාලයට ය.

Department of Education – Western Province

(39) ''පරපුටු .................... වසන්නේ .................... ගස් මුදුනේ'' කොවුලා වන්නමට අයත් මෙම කවි පදයේ හිස්තැනට අදාල වචන දෙක වන්නේ,

(1) වෙසෙසෙන්නේ, මහාදනා
(2) හඬ නගනා , මහවන
(3) හඬ නගනා , දෙන්නේ
(4) වෙසෙසෙන්නේ, මහවන

(40) උඩරට නර්තන සම්ප්‍රදායේ කස්තිරමට සමානව සබරගමු නර්තන සම්ප්‍රදායේ නටනු ලබන්නේ,

(1) කලාසමයි.
(2) ඉරට්ටියයි.
(3) අඩව්වයි.
(4) අන්තාඩියයි.

Department of Education – Western Province